**අම්පාර නගර සභාව**
**අම්පාර දිස්ත්‍රික්කය**
**--------------------**

## 1 මූල්‍ය ප්‍රකාශන

**----------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

**--------------------------------**

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 සැප්තැම්බර් 10 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ඔක්තෝබර් 31 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

**-------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට අම්පාර නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය සහ සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

**----------------------------------------------**

#### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

**----------------------------**

2017 වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේදී අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන වලින් හෙළිදරව් කර නොතිබුණි.

#### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

**--------------------------**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ආපසු ගෙවිය යුතු තැන්පතුවල වටිනාකම ලෙජරය අනුව රු.10,900,265 ක් වුවත්, මූල්‍ය ප්‍රකාශවල රු.11,050,538 ක් ලෙස දැක්වීම නිසා රු.150,273 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) 2017 වර්ෂයේදී 2018 වෙනුවෙන් අයකර ගත් වරිපනම් රු.14,682 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඇ) සභාව විසින් පවත්වාගෙන යනු ලබන බැංකු ඉතුරුම් ගිණුම් 01 කට අදාලව සමාලෝචිත වර්ෂය සඳහා වන රු.91,224 ක් වූ පොළී ආදායම, ආදායම් වියදම් ගිණුමේ ආදායමක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ ආදායම් වියදම් ගිණුමේ රු.5,212,957 ක් වූ අතිරික්තය ශේෂ පත්‍රයේ සමුච්චිත අරමුදල් ඌණතා ගිණුමට රු.5,071,530 ක් ලෙස එකතු කිරීම නිසා එම ගිණුමේ වටිනාකම රු.141,427 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය තුලදී ස්ථාවර වත්කම් වල වැඩිවීම රු.11,966,674 ක් වුවත්, ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීම සහ ප්‍රාග්ධන ගිණුමට ආධාර මඟින් දායක වීම යන ගිණුම්වල වැඩිවීම රු.19,408,008 ක් ලෙස රු.7,441,334 කින් වැඩියෙන් දක්වා ශේෂ පත්‍රය සමාන කර තිබුණි.

(ඊ) 2017 දෙසැම්බර් 31 දින ගෙවිය යුතු එකතු කල අගය මත බදු ලෙජරය අනුව වටිනාකම රු.3,337,181 ක් වුවත්, මූල්‍ය ප්‍රකාශන වල එම වටිනාකම රු.3,106,385 ක් ලෙස රු.230,796 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(උ) දේශීය ණය සංවර්ධන අරමුදලින් ලබාගත් රු.3,862,651 ක ණය මුදලින් ඉදිකරන ලද ආදාහනාගාරය ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(ඌ) සභාවට අයත් ගොඩනැගිලි 19 ක් සම්බන්ධයෙන් නිවැරදි තක්සේරුවක් සිදුකර එම වටිනාකම් ගිණුම්වලට ගෙන නොතිබීම හේතුවෙන් සභාවේ ගොඩනැගිලි වත්කම් මූල්‍ය ප්‍රකාශන වල නිරූපණය වී නොතිබුණි.

(එ) 2016 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව සමාලෝචිත වර්ෂය තුලදී වෙන්දේසි කරන ලද රු.6,350 ක් වටිනා අයිතම 97 ක පිරිවැය ගිණුම් පොත් වලින් කපා හැරීමට කටයුතු කර නොතිබුණි.

(ඒ) මත්පැන් හලෙහි අවසන් තොගයේ පිරිවැය වටිනාකම රු.2,043,021 ක් වුවත්, ශේෂ පත්‍රයේ අවසන් තොගය විකුණුම් වටිනාකම මත රු.2,474,218 ක් ලෙස දක්වා තිබීමෙන් අවසන් තොගයේ වටිනාකම හා දළ ලාභය රු.431,197 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඔ) 2017දෙසැම්බර් 31 වැනි දින ට බැංකු ගිණුමේ පවතින සභාවට අයත් නගර සභාවේ ආරක්ෂක අරමුදලේ වටිනාකම රු.61,977 ක් ගිණුම්ගත කර නොතිබුණි.

### 1.3.3 අනුකූල නොවීම්

-------------------

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති,රීති සහ රෙගුලාසි ආදියට යොමුව | වටිනාකම | අනුකූල නොවීම් |
|---|---|---|
| | (රු.) | |
| (අ) නගර සභා ආඥා පනතේ (255 වන අධිකාරය) 177 (2) වගන්තිය | - | වාර්ෂික ගිණුම් සාරාංශය සෑම වර්ෂයකම මාර්තු 01 දිනට හෝ පෙර ගැසට් පත්‍රයක ප්‍රසිද්ධ කිරීමට කටයුතු කලයුතු වුවත්, එසේ කටයුතු කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | |
| (i) මුදල් රෙගුලාසි 396 (ඈ) | 20,305 | ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ මාස 06 ඉක්මවා තිබූ රු.20,305 ක් වටිනා චෙක්පත් 08 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 571 | 4,457,022 | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වටිනාකම වූ රු.4,457,022ක් වූ වර්ෂ 02 ඉක්මවූ තැන්පතු 104 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2002 නොවැම්බර් 28 දිනැති IAI/2002/02 භාණ්ඩාගාර චක්‍රලේඛය | - | පරිගණක හා පරිගණක උපාංග සම්බන්ධයෙන් වෙනම ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| (ඈ) | 2016 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 30/2016 | - | සභාව සතු ඉන්ධන පරීක්ෂාව සිදුකල යුතු වාහන 23 ක් සම්බන්ධයෙන් ඉන්ධන පරීක්ෂාව සිදුකර නොතිබුණි. |
| (ඉ) | මුදල් අමාත්‍යාංශයේ 2008 දෙසැම්බර් 31 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ 142 | 123,420 | රාජ්‍ය නිලධාරින් වෙත ලබාදෙන ආපදා ණය වටිනාකම උපරිමය රු.250,000 කට සීමාවිය යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේදී නිලධාරින් 03 දෙනෙකු සම්බන්ධයෙන් චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නගර සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.16,744,657ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.9,027,064 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් සහ හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | **2017** | | | | **2016** | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම් | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම් | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i). | වරිපනම් හා බදු | 10,720,000 | 11,188,507 | 9,955,907 | 25,781,795 | 10,120,000 | 11,816,199 | 9,840,913 | 24,549,195 |
| (ii). | කුලී | 7,723,650 | 6,212,365 | 7,156,619 | 2,571 | 5,700,000 | 7,218,900 | 6,308,575 | 946,825 |
| (iii). | බලපත්‍ර ගාස්තු | 866,000 | 1,939,152 | 1,939,152 | - | 1,950,000 | 1,739,848 | 1,939,152 | - |
| (iv). | වෙනත් ආදායම් | 28,903,475 | 26,931,731 | 26,003,175 | 1,984,431 | 15,720,000 | 38,636,69326,625,856 | | 1,055,875 |

## 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාව විසින් 2017 දෙසැම්බර් 31 දිනට අයකළ යුතු මුළු ආදායම රු.72,823,650 ක් වූ අතර, වර්ෂය තුල රු.45,054,853 ක් අයකර ගෙන තිබුණි. ඒ අනුව ආදායම් රැස් කිරීමේ ප්‍රතිශතය 62% ක මට්ටමක පවතින බව නිරීක්ෂණය විය.

## 2.2.3 වරිපනම් හා බදු

2012 වර්ෂයේ සිට 2017 දෙසැම්බර් 31 දින දක්වා අයකර ගත යුතු වරිපනම් බදු රු.25,781,795 ක් අයකරගෙන නොතිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කාර්යසාධනය

නගර සභා ආඥා පනතේ 4 වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

නගර සභා ආඥා පනතේ 157 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබුණු නමුත්, 2017 දෙසැම්බර් 31 දින වනවිටත් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි.

(ආ) ක්‍රියාකාරි සැලැස්ම

2014 පෙබරවාරි 17 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2014 ප්‍රකාරව සභාව විසින් 2017 වර්ෂය සඳහා ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

## 3.2 කළමණාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව විසින් 2009 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා එකතු කරන ලද රු.3,106,385 ක එකතුකළ අගය මත බදු මුදල් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත නිරවුල් කර නොතිබුණි.

(ආ) 2016 අංක 20 දරන එකතු කළ අගය මත බදු (සංශෝධිත) පනත අනුව බදු අයකළ හැකි ආදායම රු.මිලියන 12 ට වැඩි නම් එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි විය යුතු වුවත්, 2017 වර්ෂය සඳහා සභාවේ බදු අය කළ යුතු ආදායම රු.14,487,175 ක් ලෙස පැවතියද, එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි වී නොතිබුණි.

(ඇ) 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත අනුව මුද්දර ගාස්තු කාර්තුවක් අවසන්වී දින 15 ක් ඇතුළත දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත යැවිය යුතු වූවත්, සභාව විසින් වටිනාකම රු.23,400 ක් වූ මුද්දර බදු දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත යවා නොතිබුණි.

(ඈ) සභාවේ බැංකු ගිණුමේ 2016 ජූනි 30 දින සිට 2017 දෙසැම්බර් 26 දක්වා කාලය තුල උපලබ්ධි නොවූ තැන්පත් රු.4,342 ක් සහ හඳුනානොගත් තැන්පත් රු.90,720 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

**3.3 මානව සම්පත් කළමනාකරණය**

----------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාවේ ගණකාධිකාරි තනතුර 2010 සිට පුරප්පාඩුවී තිබුණි.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩලයේ තනතුරු 16 ක් සඳහා නිලධාරීන් 23 දෙනෙකුගේ පුරප්පාඩු සහ තනතුරු 01 ක අතිරික්තයක් පැවතුණි.

**3.4 වත්කම් කළමනාකරණය**

------------------------------

**3.4.1 පවරා නොගත් වත්කම්**

------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) ප්‍රාදේශීය ලේකම් වෙත අයිතිය ඇති, සභාව විසින් භාවිතා කරන ඉඩම් 47 ක අයිතිය සභාව වෙත පවරා ගැනීමට කටයුතුකර නොතිබුණි.

(ආ) සභාව විසින් භාවිතයට ගනු ලබන වාහන 10 ක අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.4.2 නිෂ්ක්‍රීය, ඌන උපයෝජිත වත්කම්**

------------------------------------

අම්පාර මහජන උද්‍යානයේ ප්‍රධාන ගොඩනැගිල්ල හා එහි අනෙකුත් ඉදිකිරීම් සම්බන්ධව නිරීක්ෂණ පහත පරිදි විය.

(අ) උද්‍යානයේ මුළුතැන්ගෙය රු.4,432,775 ක් වැය කර ඉදිකර 2014 ජූලි 02 දින සභාව වෙත භාරදී තිබූ නමුත්, 2018 ඔක්තෝබර් 19 දින විටත් එම ගොඩනැගිල්ල නිෂ්ක්‍රීයව පැවතුණි.

(ආ) උද්‍යානයේ ළමා ක්‍රීඩා උපකරණ සවිකර ඇති ස්ථානයේ බිම ඇතිරීම සඳහා 2014 අගෝස්තු 29 දින රු.352,000 ක් වැය කර මිළදී ගෙන තිබූ රබර් කාපට් ඇතිරීමකින් තොරව මහජන උද්‍යානයේ මුළුතැන්ගෙය තුල වසර 03 කට වැඩි කාලයක් ගොඩගසා තිබුණි.

(ඇ) ප්‍රධාන ගොඩනැගිල්ලට දැයට කිරුළ ව්‍යාපෘතිය යටතේ 2015 ජනවාරි 02 දින මිළදී ගත් රු.435,200 ක් වටිනා පුටු 64 ක් සභා පරිශ්‍රයේ ඉහළ මහලේ වර්ෂ 02 කට ආසන්න කාලයක් තිස්සේ අවිධිමත් ලෙස ගොඩ ගසා තිබුණි.

(ඈ) සභාවට ආදායම් ඉපයීමේ අරමුණින් මෙම උද්‍යානය සහ ගොඩනැගිලි, 2013 වර්ෂයේදී රු.මිලියන 21 කට වැඩි මුදලක් හා 2017 වර්ෂයෙහි රු.2,720,848 ක මුදලක් වැයකර ඉදිකර තිබුණද, 2017 දෙසැම්බර් 14 විගණිත දිනය දක්වා ඉන් කිසිදු ආදායමක් උපයා නොතිබුණි.

**3.4.3 වාහන උපයෝජනය**

---------------------

සභාව සතු දැනට භාවිතයට ගන්නා වාහන 19 ක් සඳහා වසර 03 කට වඩා වැඩි කාලයක සිට ආදායම් බලපත්‍ර සහ රක්ෂණාවරණ ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.5 ප්‍රසම්පාදනය**

----------------

**3.5.1 ප්‍රසම්පාදන සැලැස්ම**

-----------------------

2006 මාර්තු 24 දින නිකුත් කරන ලද ජාතික අයවැය චක්‍රලේඛ අංක 128 අනුව සභාව විසින් 2017 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**3.5.2. කොන්ත්‍රාත් පරිපාලනය**

------------------------

දැයට කිරුළ වැඩසටහන යටතේ රු.2,878,428 ක් වැයකර 2014 වර්ෂයේ තිස්සපුර එක්සත් වැඩිහිටි සුභසාධන සමිතිය මඟින් ඉදිකරන ලද මුළුතැන්ගෙය හා වැසිකිළි සහ නාන කාමර වර්ෂයක් ගතවීමට පෙර භාවිතයට ගත නොහැකි තත්ත්වයට පත්වීම නිසා ඒවා කඩා ඉවත් කර තිබුණි. මෙයට අදාල අතරුඳවුම් මුදල ද මේ වන විට කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි.

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

--------------------------------------

**4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

------------------------------

සමාලොචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණේ 2018 සැප්තැම්බර් 10 දින දීය.

**4.2 අයවැය පාලනය**

--------------------

සමාලෝචිත වර්ෂයේ අයවැයගත වියදම සහ තථ්‍ය වියදම අතර සියයට 10 සිට සියයට 165 දක්වා පරාසයක විචලනයන් පැවැති බැවින්, අයවැය ලේඛනය සඵල කළමණාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

**5. පද්ධති හා පාලනය**

---------------------------------------

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කළ යුතුව ඇත.

| පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|
| (අ) ආදායම් පරිපාලනය | - | i. හිඟ ආදායම් අයකර නොගැනීම.<br>ii. අතුරු ව්‍යවස්ථා නොපැනවීම.<br>iii. ආදායම් ප්‍රභව හඳුනා නොගැනීම. |
| (ආ) අයවැය පාලනය | - | අයවැය නිවැරදිව පිළියෙල නොකිරීම හා විචලනයන් අවම නොකිරීම. |
| (ඇ) ගබඩා පරිපාලනය | - | ක්ෂණිකව හරි වැරදි බැලිය හැකි ආකාරයට භාණ්ඩ ගබඩා නොකිරීම. |
| (ඈ) වත්කම් උපයෝජනය | - | ස්ථාවර වත්කම් නිසි පරිදි නඩත්තු නොකිරීම හා නිෂ්කාර්යව පැවතීම. |

| | | | | |
|---|---|---|---|---|
| (ඉ) | ගිණුම්කරණය | - | වත්කම් ගිණුම්ගත නොකිරීම. | |
| (ඊ) | කොන්ත්‍රාත් පාලනය | - | (i) | ප්‍රමාණවත් අධීක්ෂණයක් නොමැති වීම. |
| | | | (ii) | ඉදිකිරීම් ලිපිගොනු නිවැරදිව පවත්වා නොගැනීම |
| | | | (iii) | චක්‍රලේඛ අනුව වැඩ ඉටු කිරීමේ දුර්වලතා පැවතීම |